සැ. යු.- 2012.03.23 දින පළ වූ අංක 1751 දරන ගැසට් පත්‍රයේ I – III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,752 - 2012 මාර්තු මස 30 වැනි සිකුරාදා - 2012.03.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 393 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 398 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 අප්‍රේල් මස 05 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 මාර්තු මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

391 - B 80346 — 8955 (2012/03)
B1-

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### නිලධාරි පුරප්පාඩු

1. ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාවේ පහත සඳහන් ශාඛාවන්හි ඉඳුරාම අධිකාරියට පත්කොට බඳවා ගැනීමට පිරිමි/කාන්තා අපේක්ෂකයින් සඳහා පුරප්පාඩු පවතී :-

(අ) පරිපාලන ශාඛාව
(ආ) ගුවන් තොටුපළ නිර්මාණ ශාඛාව
(ඇ) වෛද්‍ය ශාඛාව
(ඈ) දන්ත වෛද්‍ය ශාඛාව

2. පහත සඳහන් වෘත්තීය සුදුසුකම් ඇති පිරිමි/කාන්තා අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. :-

(අ) පරිපාලන ශාඛාව :
පරිපාලන නිලධාරීන් - පිරිමි (නිත්‍ය)

* පිළිගත් විශ්වවිද්‍යාලයක වාණිජවේදී/කළමණාකරණ/කලා උපාධියක් ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකම් තිබීම සමග කළමණාකරණය/ගණකාධිකරණය පිළිබඳව අදාල ක්ෂේත්‍රයේ වෘත්තීය පිළිබඳ වසරක පළපුරුද්දක් ලබා තිබීම; හෝ
* වරලත් ගණකාධිකරණය පිළිබඳ විශිෂ්ට නිපුණතාවයක් හා විගණනය පිළිබඳ වසරක පළපුරුද්දක් ලබා තිබීම; හෝ
* මානව සම්පත් කළමණාකරණය පිළිබඳ එක් වසරක ඩිප්ලෝමාවක් ලබා තිබිය යුතු අතර කළමණාකරණය/ගණකාධිකරණය පිළිබඳ අදාල ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්දක් ලබා තිබීම සහ අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) එක් වරකදී විෂයයන් 06 කින් සමත්ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාවට සහ ගණිතය හෝ විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථයන් සහ සිංහල/දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම; හෝ,
* වරලත් ගණකාධිකාරීන්ගේ අන්තර් මාධ්‍ය විභාගය සමත්ව තිබිය යුතු අතර කළමණාකරණය/ගණකාධිකරණය පිළිබඳ අදාල ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්දක් ලබා තිබීම සහ අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) එක් වරකදී විෂයයන් 06කින් සමත්ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාවට සහ ගණිතය හෝ විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථයන් සහ සිංහල/දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා සිටිය යුතුයි.

(ආ). ගුවන් තොටුපළ නිර්මාණ ශාඛාව :

*ඉංජිනේරු නිලධාරීන් (සිවිල්/කාර්මික/විදුලි) - පිරිමි/කාන්තා(නිත්‍ය/ස්වේච්ඡා) :*

* සිවිල්/කාර්මික/විදුලි ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය සමග වරලත් ඉංජිනේරු සුදුසුකම් ලබා තිබීම සහ ශ්‍රී ලංකා ඉංජිනේරුවන්ගේ ආයතනයේ සාමාජිකත්වය (MIE) ලබා තිබීම සහ වරලත් ඉංජිනේරු සුදුසුකම්වලින් පසුව අදාල ක්ෂේත්‍රයේ වසර තුනක (3) පළපුරුද්දක් ලබා තිබීම; හෝ
* සිවිල්/කාර්මික/විදුලි ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය සමග වරලත් ඉංජිනේරු සුදුසුකම් ලබා තිබීම සහ ශ්‍රී ලංකා ඉංජිනේරුවන්ගේ ආයතනයේ සාමාජිකත්වය (MIE) ලබා තිබීම; හෝ
* විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් සිවිල්/කාර්මික/විදුලි ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය ලබා තිබීම සහ ශ්‍රී ලංකා ඉංජිනේරුවන්ගේ ආයතනයේ සහකාර සාමාජිකත්වය (AMIE) ලබා තිබීම; හෝ
* සිවිල්/කාර්මික/විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (එන්ඩීටී)/එන්ඩීඊඑස්/එච්එන්ඩීඊ/හෝ විවෘත විශ්වවිද්‍යාලයේ සිවිල්/කාර්මික/විදුලි ඉංජිනේරු ඩිප්ලෝමාව ලබා තිබිය යුතු අතර ඩිප්ලෝමා සුදුසුකම්වලින් පසුව අදාල ක්ෂේත්‍රයේ වසර තුනක (3) පළපුරුද්දක් සහිත සහ රහිත අපේක්ෂකයින් හට මේ සඳහා අයදුම් කළ හැක.

*වාස්තු විද්‍යාඥ - පිරිමි/කාන්තා(නිත්‍ය/ස්වේච්ඡා)*

* B Arch උපාධිය සමග වරලත් වාස්තු විද්‍යාඥ සුදුසුකම් ලබා තිබීම හෝ BSc (BE) උපාධිය, MSc (Arch) උපාධිය සමග වරලත් වාස්තු විද්‍යාඥ සුදුසුකම් ලබා තිබීම; හෝ
* B Arch උපාධිය හෝ BSc (BE) උපාධිය ලබා තිබීම.

*ප්‍රමාණ සමීක්ෂක නිලධාරි - පිරිමි/කාන්තා/(නිත්‍ය/ස්වෙච්ඡා)*

* BSc (QS) උපාධිය සමග ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයින්ගේ ආයතනයේ සාමාජිකත්වය (Graduate Member) ලබා තිබීම; හෝ
* ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයින්ගේ ආයතනයේ සාමාජිකත්වය (Technical Member) ලබා තිබීම සහ සාමාජිකත්වයෙන් පසුව අදාල ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්දක් ලබා තිබීම.

*මිනින්දෝරු නිලධාරීන් - පිරිමි (නිත්‍ය/ස්වේච්ඡා)*

* මිනින්දෝරු විද්‍යාවේදී උපාධියක් හෝ
* දියතලාව මිනුම් සහ සිතියම් ගත කිරීමේ ආයතනයේ ඩිප්ලෝමාවක් ලබා තිබීම සහ ඩිප්ලෝමාව ලබා ගැනීමෙන් පසුව වසර තුනක (3) අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

*සැලකිය යුතුයි :*

(1) තෝරාගනු ලබන අපේක්ෂකයින් අකුරේගොඩ, බත්තරමුල්ලේ පිහිටි ආරක්ෂක මූලස්ථාන සංකීර්ණයේ ප්‍රධාන වශයෙන් සේවයේ යොදවනු ලැබේ.
(2) වෘත්තීය සුදුසුකම්වලින් පසුව මහල් නිවාස ඉදිකිරීම් ව්‍යාපෘති ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

*(ඇ).* වෛද්‍ය ශාඛාව :

වෛද්‍ය නිලධාරීන් - පිරිමි/කාන්තා(නිත්‍ය/ස්වේච්ඡා)

*ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට්* : පිළිගත් විශ්ව විද්‍යාලයක වෛද්‍ය (එම්. බී. බී. එස්) උපාධිය හෝ ඒ හා සමාන සුදුසුකම් තිබීම සහ වෛද්‍ය සභා මණ්ඩලයේ ලියාපදිංචි වී තිබිය යුතුය.

*(ඈ).* දන්ත වෛද්‍ය ශාඛාව

*දන්ත වෛද්‍ය නිළධාරීන් - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)*

*ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට්* : පිළිගත් විශ්වවිද්‍යාලයක දන්ත වෛද්‍ය (බී. ඩී. එස්) උපාධිය හෝ ඒ හා සමාන සුදුසුකම් තිබීම සහ වෛද්‍ය සභා මණ්ඩලයේ ලියාපදිංචි වී තිබිය යුතුය.

*දන්ත වෛද්‍ය ශිෂ්‍යයන් - (පිරිමි/කාන්තා (නිත්‍ය) :*

පයිලට් ඔෆිසර් : බී. ඩී. එස්. දෙවැනි කොටස සම්පූර්ණ කර දැනට තුන්වන වසරේ දන්ත වෛද්‍ය (බී. ඩී. එස්) උපාධිය සඳහා ඉගෙනුම ලබන සිසුන් හට මේ සඳහා අයදුම් කළ හැක.

ෆ්ලයින් ඔෆිසර් : අවසාන බී. ඩී. එස්. පළමු කොටස සම්පූර්ණ කර දැනට අවසන් වසරේ දන්ත වෛද්‍ය (බී. ඩී. එස්) උපාධිය සඳහා ඉගෙනුම ලබන සිසුන් හට මේ සඳහා අයදුම් කල හැක.

***සැළකිය යුතුයි :***

(1). තෝරාගනු ලබන දන්ත වෛද්‍ය ශිෂ්‍ය අයදුම්කරුවන් ෆ්ලයිට් ලෙප්ටිනන්ට් නිලයෙහි ස්ථිර අධිකාරියට පත් කරනු ලැබූ දින සිට වසර දහයක අනිවාර්ය සේවයකට යටත් කරනු ලැබේ.

(2). තෝරාගනු ලබන දන්ත වෛද්‍ය සිසුන් අවසන් වසර සම්පූර්ණ කරන තුරු ගුවන් හමුදාවෙන් නිදහස් කරනු ලැබේ. දන්ත වෛද්‍ය (බී.ඩී.එස්) උපාධිය සම්පූර්ණ කිරීමෙන් පසු සහ වෛද්‍ය සභා මණ්ඩලයේ ලියාපදිංචි වීමෙන් අනතුරුව ඔවුන් ෆ්ලයිට් ලෙප්ටිනන්ට් නිලයෙහි ස්ථිර අධිකාරියට පත් කරනු ලැබේ.

(3). පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා සේවා අවශ්‍යතාවයන් මත අවස්ථාවන් දෙනු ලැබේ.

(4). දන්ත වෛද්‍ය සිසුන් තම විශ්වවිද්‍යාලයේ අධ්‍යයන වසර තහවුරු කරගත හැකි ලියවිල්ලක් අයදුම්පත සමග එවිය යුතුය.

3. *අනෙකුත් සුදුසුකම් :-*

| | | |
|---|---|---|
| *(අ).* | *පුරවැසිභාවය* | : ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය |
| *(ආ).* | *සිවිල් තත්වය* | : විවාහක/අවිවාහක |
| *(ඇ).* | *ස්ත්‍රී පුරුෂ භාවය* | : පිරිමි/කාන්තා (අදාල පරිදි) |
| *(ඈ).* | *උස* | : පිරිමි - අඩි 5 අඟල් 5 ක් හෝ ඊට වැඩි විය යුතුය.<br>කාන්තා - අඩි 5 අඟල් 4 ක් හෝ ඊට වැඩි විය යුතුය. |
| *(ඉ).* | *බර* | : ශරීර ස්කන්ධ දර්ශකය ගුවන් හමුදා ශාරීරික නිපුණතා පරීක්ෂණ ප්‍රමිතියට අදාලව විය යුතුයි.<br>ශරීර ස්කන්ධ දර්ශකය : $\frac{\text{බර (කි. ග්‍රෑ)}}{\text{උස}^{2}\text{ (මී.)}}$ |
| *(ඊ).* | *වයස* | : 2012 මැයි මස 31 වැනි දිනට |

(1) *පරිපාලන ශාඛාව හා දන්ත වෛද්‍ය* : අවුරුදු 30ට නොවැඩි *(ශාඛාව - දන්ත වෛද්‍ය ශිෂ්‍යයන්)* විය යුතුය.

(2) *ගුවන් තොටුපළ නිර්මාණ, වෛද්‍ය* : අවුරුදු 35 ට නොවැඩිවිය යුතුය. *ශාඛාවන් සහ දන්ත වෛද්‍ය ශාඛාව (දන්ත වෛද්‍ය නිලධාරීන්)*

*(උ).* පපුව : අඟල් 32 ට නොඅඩු විය යුතුයි (පිරිමි)

*(ඌ).* වර්ණ දෘෂ්ඨිය : සීපී 2

*(එ).* දෘෂ්ඨි තීක්ෂණත්වය : වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් සහිතව හෝ රහිතව)

4. යම් අයදුම්කරුවෙකුගේ උස නියමිත පරිදි නොමැති වුව ද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් ඇත්නම් ගුවන් හමුදාධිපතිගේ මනාපය පරිදි ඔහු/ඇය ගැන සලකා බලනු ලැබේ.

5. ගුවන් හමුදාධිපතිවරයා විසින් නියම කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් වීමට හැකි ආකාරයට මනා සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතුය.

6. ක්‍රීඩා ක්ෂේත්‍රයේ වර්තමාන විශිෂ්ට දක්ෂතා ලබා තිබීම පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

7. *රාජ්‍ය භාෂා අවශ්‍යතා* : තෝරාගනු ලබන අපේක්ෂකයින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස විශේෂයෙන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පවත්නා, පනවා ඇති සහ මතු පනවනු ලබන්නාවූ ද ව්‍යවස්ථා පිලිපැදිය යුතුය.

8. තෝරාගනු ලබන අපේක්ෂකයින්ට ඔවුන්ගේ සුදුසුකම් හා පලපුරුද්ද අනුව ගුවන් හමුදාවේ පයිලට් ඔෆිසර්/ෆ්ලයින් ඔෆිසර්/ෆ්ලයිට් ලෙප්ටිනන්ට්/ස්කොඩ්‍රන් ලීඩර් යන නිලයන් හි නිත්‍ය/ස්වෙච්ඡා අධිකාරියට පත් කරනු ලැබේ.

9. තෝරා ගනු ලබන අපේක්ෂකයින් ගුවන් හමුදාපති විසින් තීරණය කරනු ලැබිය හැකි ස්ථානයක දී පුහුණුවක් ලැබිය යුතුය. පුහුණුවන අවස්ථාවේදී විෂමාචාරය නිසා හෝ තමාට පාලනය කරගත හැකිව තිබූ වෙනත් කරුණු නිසා හෝ නිලධාරියෙකුට නුසුදුසු බවට වගකිව යුත්තන් විසින් වාර්තා කරනු ලැබුවහොත් එම නිළධාරියාට පිරිනමනු ලැබූ අධිකාරිය ආපසු ගැනීම සහ/හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විනය රෙගුලාසි වලට අනුකූලව වෙනයම් විනයානුකූල ක්‍රියාමාර්ගයන්ට යටත්වීමට හෝ බැඳී සිටින්නේය.

10. විටින් විට පනවනු ලබන ගුවන් හමුදා නියෝග අනුව ගුවන් හමුදා නිලධාරීන් පාලනය කරනු ලැබේ.

11. 1951 අප්‍රේල් මස 27 වැනි දින අංක 10,240 දරන *ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධනය කරන ලද, ශ්‍රී ලංකා ගුවන් හමුදා (නිත්‍ය හා නිත්‍ය උපසේවා) රෙගුලාසි අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධාරියෙකුගේ සේවා කොන්දේසි වේ. සුදුසුකම් අනුව ෆ්ලයිට් ලෙප්ටිනන්ට් හෝ උසස් නිලයක නිත්‍ය/ස්වෙච්ඡා අධිකාරියක් පිරිනමනු ලැබේ. ගුවන් හමුදා පනතේ 10 වැනි වගන්තිය අනුව "සෑම නිලධාරියෙකුම සේනාධිනායකයාගේ මනාපය පරිදි තම පත්වීමේ සිටිය හැක" කෙසේ වෙතත් තම අධිකාරියෙන් අස්වීමට නිලධාරියෙකුට බලයක් නැති අතර, ගුවන් හමුදා පනතේ 11 වැනි වගන්තිය අනුව සේනාධිනායක විසින් අස්වීමට ඉඩදිය හැක. ඇප/ගිවිසුම් බැඳී ඇත්නම් පුහුණු කාලය සහ පාඨමාලාවන් හදාරන්නේනම් ඉහත සඳහන් පරිදි ගුවන් හමුදා පනතේ 11 වැනි වගන්තිය අනුව අස්වීමට නොහැක. ගුවන් හමුදාවේ විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික රෙගුලාසිවලට අනුව ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගැනීමට හැකි වේ.

12. ගුවන් හමුදා නිලධාරීන් රාජකාරි හෝ පුහුණුව සඳහා ඕනෑම අවස්ථාක දී ලෝකයේ කවර තැනකට වුව ද යවනු ලැබීමට යටත් වේ.

13. අවිවාහක නිලධාරීන්, නිලධාරී නිවස්නයේ වාසය කල යුතුය. ගෘහ භාණ්ඩ සහ නවාතැන් පහසුකම් හා ආහාරපාන ඔහුට/ඇයට සපයනු ලැබේ. බැට්මන් සේවයද සපයනු ලැබේ. අවිවාහක නිළධාරීන්ගේ ආහාර දීමනාව සහ බැට්මන් දීමනාව භෝජනාගාරයට ගෙවනු ලැබේ.

14. විවාහක නිලධාරීන්ට විවාහක නිවාස ඇත්නම් සපයනු ලැබේ. මේ සඳහා රජයේ ආයතන සංග්‍රහයට අනුව කුලිය අයකරනු ලැබේ. විවාහක නිලධාරීන් විවාහක නිවස්නයක වාසය කරනු නොලබන්නේ නම් 15(ආ) (17) ඡේදයේ පරිදි නිවාස කුලී දීමනාවන් හිමි වේ.

15. *(අ).* ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරිලත් නිලධාරීන්ගේ වැටුප් පහත සඳහන් පරිදි වේ :-

| | |
|---|---|
| පයිලට් ඔෆිසර් | - රු. 2,29,200.00 වසරකට |
| ෆ්ලයින් ඔෆිසර් | - රු 2,75,220.00 - 34 x 7,740.00 =<br>රු. 5,38,380.00 වසරකට |
| ෆ්ලයිට් ලෙප්ටිනන්ට් | - රු. 3,21,660.00 - 28 x 7,740.00 =<br>රු. 5,38,380.00 වසරකට |

| | |
|---|---|
| ස්ක්‍රොඩ්‍රන් ලීඩර් | - රු.352,620.00 - 24 x 7,740.00 = රු. 538,380.00 වසරකට |
| විංග් කමාන්ඩර් | - රු.362,100.00 - 20 x 9,480.00 = රු. 551,700.00 වසරකට |
| ගෲප් කැප්ටන් | - රු. 441,060.00 - 18 x 12,600.00 = රු. 667,860.00 වසරකට |

*(ආ).* වෛද්‍ය සහ දන්ත වෛද්‍ය නිළධාරීන්ගේ වැටුප්

| | |
|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය - | රු. 313,920.00 - 2 x 7,740.00 = රු. 329,400.00 වසරකට |
| 2 වන ශ්‍රේණිය - | රු. 337,140.00 - 8 x 7,800.00 = රු. 399,540.00 වසරකට |
| 1 වන ශ්‍රේණිය - | රු. 412,140.00 - 15 x 12,600.00 = රු. 601,140.00 වසරකට |
| විශේෂ ශ්‍රේණිය - | රු. 508,680.00 - 12 x 15,720.00 = රු. 697,320.00 වසරකට |

*(ඇ).* අනෙකුත් දීමනා වෛද්‍ය සහ දන්ත වෛද්‍ය ශාඛාවේ නිලධාරීන් සඳහා

(1) විශ්‍රාම හිමි වැටුප් දීමනා
ප්‍රාථමික ශ්‍රේණිය - රු. 1,700.00 (මසකට)
2 වන ශ්‍රේණිය - රු. 1,700.00 (මසකට)
1 වන ශ්‍රේණිය - රු. 3,400.00 (මසකට)
විශේෂ ශ්‍රේණිය රු. 3,400.00 (මසකට)

(2) විශ්‍රාම හිමි වැටුප් රහිත දීමනා

ප්‍රාථමික ශ්‍රේණිය - රු. 2,125.00 (මසකට)
2 වන ශ්‍රේණිය - රු.1,700.00 (මසකට)
1 වන ශ්‍රේණිය - රු. 400.00 (මසකට)

(3) අමතර රාජකාරි දීමනාව - රු. 15,000.00 (මසකට)

(4) අතිරේක රාජකාරි දීමනාව
ප්‍රාථමික ශ්‍රේණිය - රු. 210.00 (පැයකට)
2 වන ශ්‍රේණිය - රු. 280.00 (පැයකට)
1 වන ශ්‍රේණිය - රු. 300.00 (පැයකට)
විශේෂ ශ්‍රේණිය - රු. 350.00 (පැයකට)

(5) (15) (ඈ) ඡේදයේ දැක්වෙන සේවා දීමනා අදාල පරිදි අමතරව ගණනය කරනු ලැබේ.

ඈ. අනෙකුත් දීමනා :

(1) ජීවනාධාර දීමනාව මසකට රු. 5,850.00 ක් ගෙවනු ලැබේ.
(2) සේවා කාලය වසර පහක් සම්පූර්ණ කල පසු දිරි දීමනා වශයෙන් මසකට රු. 250.00 ක් ගෙවනු ලැබේ.
(3) දුෂ්කර දීමනා මසකට රු. 600.00 ක් ගෙවනු ලැබේ
(4) ක්‍රියාන්විත සේවයේ සේවය කරන්නන් හට රු. 5,000.00 ක් ගෙවනු ලැබේ.
(5) විශේෂ දීමනාව මසකට රු. 3,000.00 ක් ගෙවනු ලැබේ. (රාජකාරි දිනකට රු. 100.00 බැගින් ගෙවනු ලැබේ.)
(6) අතිරේක දීමනාව මසකට රු. 1,000.00 ක් ගෙවනු ලැබේ.
(7) නිළ ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව මසකට රු. 255.00 ක් ගෙවනු ලැබේ.
(8) බැට්මන් දීමනාව මසකට රු. 637.50 ක් ගෙවනු ලැබේ. (පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා)
(9) ආහාර දීමනාව මසකට රු. 13,861.50 ක් ගෙවනු ලැබේ. (පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා)
(10) සුදුසුකම් වේතනය අදාල පරිදි (මසකට උපරිමය රු. 637.50ක්) ගෙවනු ලැබේ.
(11) විශේෂ දීමනාවක් ලෙස මසකට මූලික වැටුපෙන් 10% මුදලක් ගෙවනු ලැබේ.
(12) නොමිලේ ගමන් කල හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (නිලධාරියාට/බිරිඳ/සහ දරුවන්ට) දෙනු ලැබේ.
(13) කඳවුර තුල වාසය කරන නිළධාරීන්ට මසකට වරක් නිළධාරි නිවස්නයේ සිට තම නිවාසයට යෑම සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍රයක්, කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.
(14) නිල ඇඳුම් හා ඊට අදාල අනෙකුත් භාණ්ඩ නොමිලේ සපයනු ලැබේ.
(15) නොමිලේ වෛද්‍ය පහසුකම් (තම පවුලේ සාමාජිකයින්ට අදාල පරිදි)
(16) පිටත වාසය කිරීමට බලය දී ඇති විවාහක නිළධාරීන්ට සැතපුම් 30 ක් තුල රාජකාරි ස්ථානයට නොමිලේ ගමන් කිරීම සඳහා මධ්‍යම ගමනා ගමන මණ්ඩලයේ බලපත්‍රයක් දෙනු ලැබේ.
(17) රජයේ නිවාසවල වාසය නොකරන විවාහක නිළධාරීන් හට පහත සඳහන් පරිදි නිවාස කුලී දීමනාවක් හිමිවේ. පයිලට් ඔපිසර් සිට ගෲප් කැප්ටන් සහ ඊට ඉහල නිළයන් සඳහා මසකට රු. 1,850.00 සිට රු. 4,250.00 ක්වා
(18) සේවා දීමනා මාසිකව රු. 300.00, රු 400.00, රු.500.00 සුදුසු පරිදි වේ. (සම්පූර්ණ කරන ලද සේවා කාලයන්ට අනුව වෛද්‍ය සහ දන්ත වෛද්‍ය නිලධාරීන් සඳහා පමණයි)
(19) අමතර සේවා දීමනා මසකට රු. 1,500.00 (වෛද්‍ය සහ දන්ත වෛද්‍ය නිළධාරීන් සඳහා පමණයි)
(20) 1/20 දීමනාව මසකට - මූලික වැටුප x 1/20 x උපරිම දින 3 (වෛද්‍ය සහ දන්ත වෛද්‍ය නිළධාරීන් සඳහා පමණයි)

16. *විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා* .— විටින් විට සංශෝධනය කරනු ලැබූ සහ 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය අනුව විශ්‍රාම වැටුප් පරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියළුම නිළධාරීන් දායකයන් වේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලේ දායක මුදල් 1970 රෙගුලාසි අනුවය.

17. *ඉල්ලුම්කරුවන්ට උපදෙස්* .—

*(අ).* පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුව ඉල්ලුම්පතේ සියළුම කොටු හැකි පමණ විස්තර හා පැහැදිලිව සම්පූර්ණ කළ යුතුය. ඉල්ලුම්පත් 2012 අප්‍රේල් මස 5 වන දින මධ්‍යාහ්න 1200 ට හෝ ඊට පෙර ලැබෙන සේ "ප්‍රධාන ආධුනිකයින් බඳවා ගැනීමේ නිලධාරී, ආධුනිකයින් බඳවා ගැනීමේ කාර්යාලය, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ඒකල, කොටුගොඩ " යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ ".........ශාඛාවේ අධිකාරියක් සඳහා ඉල්ලුම්පත" යනුවෙන් සඳහන් විය යුතුය. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූළ නොවන ඉල්ලුම්පත් සලකා බලනු නොලැබේ.

*(ආ).* රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයෙහි නිරත වූවන් ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කල යුතුය. යම් හෙයකින් අයදුම්කරු තෝරාගතහොත් තම කාර්යයෙන් නිදහස් කරන බවට සේවා යෝජකයා විසින් ලිපියක් මගින් දැනුම්දිය යුතුය.

*(ඇ).* ඉල්ලුම්පත් සමග අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකපත් වල පිටපත් ඉදිරිපත් කල යුතුය.

(1) උප්පැන්න සහතිකය
(2) ලබා ඇති උසස්ම අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික

(3) ඉල්ලුම්කරු පෞද්ගලිකව දන්නා වගකිව යුතු පුද්ගලයන් යටත් පිරිසෙන් දෙදෙනෙකුගෙන් ලබාගත් චරිත සහතික.

(4) ක්‍රීඩා, ශිෂ්‍ය භට පුහුණු ආදී සනාථ කරන සහතික

(5) ඉල්ලුම්පතේ යම් යම් හිමිකම් කර ඇතොත් ඒවා සනාථ කරන සහතික

*සැලකිය යුතුයි.*— මෙම සහතික වල මුල්පිටපත් ඉදිරිපත් කල යුත්තේ අපේක්ෂකයා සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබුවහොත් ඒ අවස්ථාවේදී පමණි.

18. ඉල්ලුම්පතේ අසත්‍ය ප්‍රකාශයක් කර තිබේනම් එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අහිමිවීමට ද, තෝරා ගනු ලැබීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහකරනු ලැබීමටද යටත් වේ.

19. *තෝරා ගැනීම, සම්මුඛ පරීක්ෂණ ආදිය .*—

*(අ).* ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කරුවන් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට ගුවන් හමුදාපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට හා වෛද්‍ය පරීක්ෂණවලට පෙනී සිටීමට සිදු වන්නේය. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම කරනු ලැබේ.

*(ආ).* සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන ස්ථානය, වේලාව සහ දිනය ලිපියකින් දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් දරනු ලබන ගමන් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

*(ඇ).* මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු/ඇය විසින් ඉදිරිපත් කල යුතුය.

*(ඈ).* අවසාන සම්මුඛ පරීක්ෂණයට සුදුස්සන් විය හැකි අපේක්ෂකයින් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතුය.

*(ඉ).* අපේක්ෂකයෙකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවත්, එසේ කල යුත්තේ ඔහුට/ඇයට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයෙකු තෝරා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙළඹවීම නැතහොත් බලපෑම් කිරීමට උත්සාහ දැරීම එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතු වන්නේය.

*(ඊ).* බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින් වෙත ඒ බව දන්වා එවනු නොලැබේ.

(එච්. ඩී. අබේවික්‍රම),
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ.පෙ. 594,
කොළඹ.

**ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාවේ.......................... ශාඛාවේ අධිකාරියක් සඳහා ඉල්ලුම්පත**

1. පුරවැසිභාවය :————————.
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින්ද, ලියාපදිංචි වීමෙන්ද, යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.)
2. සම්පූර්ණ නම : (ජාතික හැඳුනුම්පතට අනුව) :———————.
3. ජාතික හැඳුනුම්පත් අංකය :————————.
4. ඉල්ලුම්කරන ශාඛාව:————————.
5. ඉල්ලුම්කරන තනතුර :————————.
6. ස්ථිර ලිපිනය :————————.
7. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————————.
8. තැපැල් ලිපිනය:————————.
9. විද්‍යුත් ලිපිනය:————————.
10. උපන් දිනය :————————.
11. උස : අඩි :——— අඟල් :————————.
12. දිස්ත්‍රික්කය :————————.
13. ඡන්ද කොට්ඨාසය :————————.
14. ග්‍රාම සේවක කොට්ඨාසය:————————.
15. දුරකථන අංකය :————————.
16. විවාහක හෝ අවිවාහක බව :————————.
17. පාසල් සහ/හෝ විශ්ව විද්‍යාල පිළිබඳ විස්තර:————————.

| *පාසලේ/විශ්ව විද්‍යාලයේ නම* | *සමත් විභාගය* | *විභාගයට පෙනී සිටි වර්ෂය* | *සමත් වූ විෂයන් (ශ්‍රේණි ඇතුළුව)* |
|---|---|---|---|
| | අ.පො.ස.(සා. පෙළ)<br>අ.පො.ස.(උ.පෙළ)<br>වෘත්තීය සුදුසුකම්<br>වෙනත් | | |

18. පාසැලෙන්/විශ්ව විද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රක්ෂා පිළිබඳ විස්තර :—

| *සේවා යෝජකයාගේ නම සහ ලිපිනය* | *රැකියාවේ ස්වභාවය* | *සේවා කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |

19. මව්පියන් පිළිබඳ විස්තර :—

| *සම්පූර්ණ නම* | *උපන් ස්ථානය* | *රැකියාව* | *දැන් ලිපිනය* |
|---|---|---|---|
| පියා :-<br>මව :- | | | |

20. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :

21. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ඨතා පිළිබඳ විස්තර :- (ඔබ සහභාගී වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ඨතා දක්වන්න.)

22. පාසැලේ දී, විශ්ව විද්‍යාලයේ දී හෝ බාහිර සංවිධාන වලදී දක්වා ඇති වෙනත් විශිෂ්ඨතා (දිනයන් සමග විස්තර දක්වන්න)

23. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය

24. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මින් පෙර ඉල්ලුම් කර තිබේ ද? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම් වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න.

25. සිවිල් හෝ යුද්ධ උසාවියක දී වැරදිකරු වී හෝ ඇග බැඳ .තිබේද? එසේ නම් විස්තර සඳහන් කරන්න.

26. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි / මණ්ඩලයක /සංස්ථාවක(මහ බැංකු, ජාතික බැංකු, විශ්ව විද්‍යාල, රජය විසින් පාලන කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :——————.

27. චරිත සහතික පිළිබඳ විස්තර

| නම | පදවිය | තැපැල් ලිපිනය |
|---|---|---|
| | | |

28. *අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය* :-

පූර්වෝක්ත ප්‍රශ්න වලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරි සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාල වන ව්‍යවස්ථාද මම කියවා අවබෝධ කර ගතිමි.

——————.
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය:——————.

03-1099

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු පුත්තලම දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ:

01. ඉල්ලුම්කරුවන් අදාල උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හා සෑහෙන දේපලක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අයද විය යුතු ය.
02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.
03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.
04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.
05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති හා සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශණය කර ඇති දැන්වීම් වලින් බලාගත හැකිය.
06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත්‍ර අදාල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකිය.
07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2012 අප්‍රේල් මස 30 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 මාර්තු මස 13 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/A3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දීය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| පුත්තලම | වෙන්නප්පුව | කම්මල්පත්තුව කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ දකුණු පිටිගල් කෝරළේ කොට්ඨාසයේ විවාහ(සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධුරය. | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පුත්තලම. |

03-1107

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය**

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ II පන්තියේ "ආ" ඛණ්ඩයේ කාර්මික සහකාර තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2012**

වෙරළ සංරක්‍ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ II පන්තියේ 'ආ' ඛණ්ඩයේ කාර්මික සහකාර තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන්, වෙරළ සංරක්‍ෂණ හා වෙරළ සම්පත් කළමණාකරණ අධ්‍යක්‍ෂ ජනරාල් විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

බඳවාගනු ලබන තනතුරු සංඛ්‍යාව - 03 යි.

02. *සේවා කොන්දේසි* .— රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසි වලට ද, මෙහි පහත සඳහන් කොන්දේසිවලට ද, යටත්ව කාර්මික සහකාර II පන්තියේ 'ආ' ඛණ්ඩයේ තනතුරට බඳවා ගනු ලැබේ.

2.1 තෝරාගනු ලබන නිලධාරීන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ කොන්දේසියට යටත් වේ.

2.2 පත්වීම වසර 03 ක පරිවාස කාලයකට යටත් කරනු ලැබේ. දැනට රාජ්‍ය සේවයේ තනතුරක ස්ථිර කරන ලද නිලධාරියෙකු පත් කරනු ලැබුවහොත් එක් අවුරුදු පරීක්ෂණ කාල සීමාවකට යටත් කරනු ලැබේ.

2.3 පත්වීම ස්ථිර කිරීම සඳහා පත්වීම් දින සිට තුන්වන වැටුප් වර්ධකය ලැබීමට පෙර පළමුවන කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

2.4 තනතුරට බඳවා ගැනීමෙන් පසු වසර 05 ක් ඇතුළත 2007.05.28 දිනැති රා. පරි. 07/2007 චක්‍රලේඛයේ විධිවිධාන පරිදි දෙවැනි රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය ලබාගත යුතුය.

2.5 පත්වීම් ලබන නිලධාරියා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගවලට ද, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන නියමයන් හා රෙගුලාසිවලටත් අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ රෙගුලාසිවලටත් යටත් වේ.

03. *වැටුප් පරිමාණය* .— රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 06/2006 (IV) හා 07/2008 අනුව, වැටුප් ක්‍රමය MN-3-2006-A රු. 15,005 - 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 - රු. 27,885 ක් වන මාසික වැටුපක් හිමිවේ.

04. *වයස් සීමාව* :

4.1 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. දැනට රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

4.2 ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

4.3 යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

05. *අධ්‍යාපන සුදුසුකම්* :

5.1 සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය, විද්‍යාව හා තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් 06 කින් අ.පො.ස. (සා.පෙළ) විභාගයට දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්වීම සහ ;

5.2 ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය, සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, යන විෂයයන් අතරින් විෂයයන් දෙකක් සහිතව විද්‍යා විෂයයන් තුනකින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) අ.පො.ස. (උ. පෙළ.) විභාගය එකවර සමත්වීම (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් තුනකින් එකවර සමත්වී තිබීම ප්‍රමාණවත් වේ.)

5.3 රාජකාරි විෂය ක්ෂේත්‍රයට අදාළ වන පරිදි පැතුරුම්පත් (EXCEL) හා Auto CAD භාවිතය පිළිබඳ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම.

06. *වෘත්තීය සුදුසුකම්* .— ඉහත 05 හි මූලික අධ්‍යාපන සුදුසුකම් සහිතව පහත සඳහන් තාක්‍ෂණ සුදුසුකම් වලින් එක් සුදුසුකමක් ලබා තිබීම:

6.1 මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්‍ෂණ ඩිප්ලෝමාව

6.2 ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව

6.3 අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව

6.4 විවෘත විශ්ව විද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්‍ෂණික ඩිප්ලෝමාව

6.5 ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පළමු වන කොටස සාර්ථක ලෙස සම්පූර්ණ කිරීම

6.6 ඉහත තාක්‍ෂණික සුදුසුකම්වලට සමාන යැයි ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම්

07. *බඳවා ගැනීමේ ක්‍රමය* .— මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන පොදු තරඟ විභාගයට පෙනී සිටිය යුතුය.
පොදු තරඟ විභාගය සඳහා නියමිත සෑම ප්‍රශ්න පත්‍රයකටම 40% ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබාගත යුතු අතර, ලකුණු ලබාගත් අනුපිළිවෙල මත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දීම සිදු නොකරන අතර, සුදුසුකම් තහවුරු කළ අයදුම්කරුවන් විභාගයේ දී ලබාගත් මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

08. *විභාගය.* :

8.1 2012 අප්‍රේල් මස අවසානයේ දී වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල් විසින් දෙපාර්තමේන්තුවේ දී මෙම විභාගය පවත්වනු ලැබේ.

8.2 මෙම විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.

8.3 අපේක්ෂකයින්ට තමන් කැමති භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකි අතර, ඉල්ලුම් කරන භාෂා මාධ්‍ය විභාගයේ දී වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

8.4 විභාග ගාස්තුව රු. 500 කි
වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල් නමට නිකුත් කරන ලද මාලිගාවත්ත, තැපැල් කාර්යාලයෙන් මුදල් කර ගත හැකිවන සේ ලබාගත් මුදල් ඇණවුමක් ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය.

8.5 *විභාග විෂයන්.* විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

1. බුද්ධි පරීක්ෂණය
2. අවබෝධය

8.6 *විෂය නිර්දේශය .—*

1. *බුද්ධි පරීක්ෂණය* - කාලය පැය 01 කි. මුළු ලකුණු 100 යි පදගත, සංඛ්‍යාත්මක සහ රූපාකාර සංදර්භනයන් තුළ ඉදිරිපත් කෙරෙන ගැටළු සම්බන්ධයෙන් අයදුම්කරුගේ නිගමනයන් හා සිතීමේ තර්කානුකූලභාවයත්, සිතීමේ, විශ්ලේෂණය කිරීමේ හා තීරණය කිරීමේ ශක්තිය මැනීම.
2. *අවබෝධය* - කාලය පැය 01 කි . මුළු ලකුණු 100 යි භාෂා අවබෝධය හා තරමක් සංකීර්ණ ඡේදයක්, ලියවිල්ලක් හෝ සංදේශයක් වටහා ගැනීම හා එහි ඇති ප්‍රධාන අදහස තමන්ගේම වචනයෙන් සාරාංශ කර පැහැදිලිව හා නිවැරදිව ප්‍රකාශ කිරීම.

09. *අයදුම්පත් එවිය යුතු ආකාරය.—*

9.1 මෙම නිවේදනයේ අවසානයේ දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රයට අනුව ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපසම යොදාගෙන, පළමු පිටුවෙහි අංක 01 සිට 05 දක්වාත් ඉතිරි කොටස අනික් පිටුවලටත් ලෙස සකස් කරන ලද ඉල්ලුම්පත්‍රය 2012 අප්‍රේල් මස 20 වැනි දිනට හෝ එදිනට පෙර අධ්‍යක්ෂ ජනරාල්, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, 4 වන මහල, නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10, යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ" ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික සහකාර තනතුරේ II 'ආ' පන්තියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

*සටහන* : රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය වේ.

9.2 සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී අයදුම්පත්‍ර නැතිවීම හෝ ප්‍රමාදවීම සම්බන්ධව කෙරෙන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

9.3 අයදුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන්ට විභාග ප්‍රවේශපත්‍රය විභාගය පැවැත්වෙන දිනට දින 07 කට කලින් නොලැබුනහොත් පහත සඳහන් විස්තර සහිතව වහාම වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල්ට දැන්විය යුතුය —

(i). අපේක්ෂකයාගේ සම්පූර්ණ නම
(ii). ලිපිනය
(iii). අයදුම්පත් තැපැල් කිරීමේ දිනය, ලියාපදිංචි අංකය, තැපැල් කාර්යාලය

10. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය —

(i). උප්පැන්න සහතිකය
(ii). අධ්‍යාපන සුදුසුකම් තහවුරු කිරීමේ සහතික
(iii). වෘත්තීය සුදුසුකම් තහවුරු කිරීමේ සහතික

*අපේක්ෂකයාගේ අනන්‍යතාවය.—* විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙක්ම විභාග ශාලාවේදී තමාගේ අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා පහත සඳහන් ලේඛන ඉදිරිපත් කළ යුතුය:

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත, හෝ
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය (විභාග දිනට වසර 03 කට කලින් නිකුත් කරන ලද)

*සාවද්‍ය තොරතුරු සැපයීම* — මෙම විභාගයට ඉදිරිපත් වීම සඳහා යම් අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක හෝ ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට හැකිවන්නේය. අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන දැන ඉදිරිපත් කළ බව පෙනී ගියහොත් ඔහු සේවයෙන් පහ කිරීමට යටත් වන්නේය.

(ii). මෙම ගැසට් නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් ගැන ගැටළුවක් මතුවුවහොත් ඒ සම්බන්ධයෙන් තීරණය ගැනීමේ බලය වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල් සතුවේ.

ආචාර්ය අනිල් ප්‍රේමරත්න,
වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත්
කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල්.

2012 මාර්තු මස 14 වැනි දින,
මාලිගාවත්ත,
වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත්
කළමනාකරණ දෙපාර්තමේන්තුවේ දීය.

*රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය*

**වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II පන්තියේ 'ආ' ඛණ්ඩයේ කාර්මික සහකාර තනතුරට බඳවා ගැනීම - 2012**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාල අංකය කොටුව තුළ ලියන්න)

01. නම :

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින් උදා : SILVA A. B.)
1.2 මුලකුරු වලින් හැඳින්වෙන නම් :————————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්) :————————.

02. ලිපිනය :

2.1 පෞද්ගලික:————————.
2.2 කාර්යාලීය:————————.
2.3 විභාග ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය:————————.

03. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග:————————.

04. 4.1 උපන් දිනය:

වර්ෂය: | | | | | මාසය: | | | දිනය: | | |

4.2 ජාතික හැඳුනුම්පත් අංකය: | | | | | | | | | | |

05. 5.1 ස්ත්‍රී/පුරුෂ භාවය :

| | |
|---|---|
| ස්ත්‍රී | |
| පුරුෂ | |

5.3 විවාහක/අවිවාහක/වැන්දඹු ද :

| | |
|---|---|
| විවාහක | |
| අවිවාහක | |
| වැන්දඹු | |

06. අධ්‍යාපන සුදුසුකම් :

6.1 අ.පො.ස. (සා/පෙළ)
වර්ෂය: විභාග අංකය:

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4 | | | |
| 5 | | | |
| 6 | | | |
| 7 | | | |
| 8 | | | |

6.2 අ.පො.ස. (උ./පෙළ) වර්ෂය: විභාගය අංකය:

| විෂයය | සාමාර්ථය |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |

07. වෘත්තිය සුදුසුකම් :

| වෘත්තිය පාඨමාලාවේ නම | පාඨමාලාව හදාරන ලද ආයතනය | පාඨමාලාවේ කාලසීමාව | සාමාර්ථය |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |
| 3 | | | |

08. පළපුරුද්ද :

| වෘත්තිය පළපුරුද්ද | ආයතනය | කාලසීමාව |
|---|---|---|
| 1 | | |
| 2 | | |

09. භාෂා කුසලතාවය පිළිබඳ විස්තර :

| භාෂාව | කියවීම | ලිවීම | කථා කිරීම |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |
| 3 | | | |

10. පරිඝනක හැකියාව පිළිබඳ විස්තර :

| සහතික | සහතික නිකුත් කළ ආයතනයේ නම | වර්ෂය | විෂයය |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |

11. විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලයේ නම:——————.
මුදල් ඇණවුම් අංකය:——————.

| |
|---|
| සම්පූර්ණ විභාග ගාස්තුව රු. 500කි. දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකින් වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල් නමට, ගෙවන කාර්යාලය මාලිගාවත්ත, (කුවිතාන්සිය මෙහි අලවන්න.) |

12. මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සඳහන් කරන ලද සියළුම තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මා මෙම තනතුරට තෝරාගැනීමට ප්‍රථම මෙහි සඳහන් කිසියම් තොරතුරක් අසත්‍ය බව හෙලි වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසුව හෙලි වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත්වන බවත් මම දනිමි.

————————
අයදුම්කරුගේ අත්සන.

දිනය:——————.

*දැනට රජයේ ස්ථිර සේවයේ නියුක්ත නිලධාරීන් සඳහා පමණක් අදාල වේ.*

**දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය**

නිලධාරියා විසින් සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්, නිලධාරියා ඉහත තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලැබුවහොත් ඔහු දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත්, සහතික කරමි.

————————
දෙපාර්තමේන්තු ප්‍රධානියා
(නිල මුද්‍රාව තැබිය යුතුය.)

පදවි නාමය:——————.
ලිපිනය:——————.
දිනය:——————.

03-1081

---

**අධිකරණ සේවා කොමිෂන් සභාව**

අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ භාෂණ පරිවර්තක (II වැනි ශ්‍රේණිය) සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2012

අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ "අධිකරණ භාෂණ පරිවර්තක" II වැනි ශ්‍රේණියට, සිංහල/දෙමළ හෝ සිංහල/ඉංග්‍රීසි හෝ දෙමළ/ඉංග්‍රීසි භාෂණ පරිවර්තකයන් බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

03. වැටුප් ක්‍රමය - මසකට රු. 15,610- 10 x 170 - 6 x 240 - 14 x 320 - රු. 23,230 වැටුප් පරිමාණයක් මෙම තනතුරට අයත්ය. මෙම තනතුරේ ආරම්භක වැටුප් පියවර රු.16,290 ක් වේ.

(සටහන : 6 වන වැටුප් පියවරට පැමිණීමට පෙර විභාගයක් සහිත 1 වන කාර්යක්ෂමතා කඩඉමක් සහ 13 වන වැටුප් පියවරට පැමිණීමට පෙර විභාගයක් රහිත II වන කාර්යක්ෂමතා කඩඉමක් ඇත.)

04. වයසඃ.— අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරුවන් අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතුයි. (රජයේ සේවයේ නියුතු නිලධාරින්ට උපරිම වයස් සීමාව ආදාල නොවේ)

05. සුදුසුකම් .— අයදුම්කරුවන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය. (1) අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයෙන් (පැරණි නිර්දේශය) විෂයන් හතරක් (04) එකවර සමත්වී තිබීම හෝ අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ (නව නිර්දේශය) විෂයන් තුනක් එකවර සමත් වී තිබීම.

(i). අයදුම්කරුවෙකු සුදුසුකම් ලත් විභාගය සමත් වී ඇත්තේ සිංහල භාෂාවෙන් නම්, යටත් පිරිසෙයින් පහත සඳහන් සෙසු සුදුසුකම්වලින් එකක් හෝ තිබිය යුතුය:

(අ) ඉංග්‍රීසි භාෂාව හෝ ඉංග්‍රීසි සාහිත්‍යයෙන් හෝ දෙමළ භාෂාව හෝ දෙමළ සාහිත්‍යයෙන් හෝ සම්මාන සාමාර්ථයක් ද, ඇතුළුව, වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, හෝ

(ii). අපේක්ෂකයෙකු සුදුසුකම් ලත් විභාගය සමත් වී ඇත්තේ දෙමළ භාෂාවෙන් නම්, යටත් පිරිසෙයින් පහත සඳහන් සෙසු සුදුසුකම්වලින් එකක් හෝ තිබිය යුතුය:

(අ) සිංහල භාෂාව හෝ සිංහල සාහිත්‍යයෙන් හෝ ඉංග්‍රීසි භාෂාව හෝ ඉංග්‍රීසි සාහිත්‍යයෙන් හෝ සම්මාන සාමාර්ථයක් ද ඇතුළුව, වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, හෝ

(iii). අපේක්ෂකයෙකු සුදුසුකම් ලත් විභාගය සමත් වී ඇත්තේ ඉංග්‍රීසි භාෂාවෙන් නම්, යටත් පිරිසෙයින් ඔහුට පහත සඳහන් සෙසු සුදුසුකම්වලින් එකක් හෝ තිබිය යුතු ය:

(අ) සිංහල භාෂාව හෝ සිංහල සාහිත්‍යයෙන් හෝ දෙමළ භාෂාව හෝ දෙමළ සාහිත්‍යයෙන් හෝ සම්මාන සාමාර්ථයක් ද ඇතුළුව, වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම.

06. නියමිත සුදුසුකම් ඇති අයදුම්කරුවන් පහත සඳහන් විෂයයන් යටතේ ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. එම විභාගයේ ප්‍රතිඵල මත නියමිත ලකුණු මට්ටමට එළඹ ඇති තැනැත්තන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීමෙන් අනතුරුව තනතුරට බඳවා ගනු ලැබේ.

(i). *නිර්දේශ පත්‍රය* - භාෂාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) සාහිත්‍යමය හෝ පොදු විෂයයන් පිළිබඳ වාක්‍ය රචනයක්, සාරාංශය ලිවීම හෝ අවබෝධය පිළිබඳ වෙනත් පරීක්ෂණ, වාග් මාලාව පිළිබඳ ප්‍රශ්න, වාග් සම්ප්‍රධාය හා එහි භාවිතය හා වැරදි නිවැරදි කිරීම ආදිය (මෙම ප්‍රශ්න පත්‍රය අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ තත්ත්වයට සමාන වනු ඇත.)

(ii). *පරිවර්තනය* - මෙම විෂය ප්‍රශ්න පත්‍ර තුනකින් යුක්ත වනු ඇත. එනම්

(i). සිංහල, දෙමළ භාෂාවට හෝ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම
(ii). දෙමළ, සිංහල භාෂාවට හෝ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම
(iii). ඉංග්‍රීසි, සිංහල භාෂාවට හෝ දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම

(අපේක්ෂකයින් විසින් සාහිත්‍යමය පාඨයක්, පොදු සැලකිල්ලට ලක් වූ පාඨයක්, නිල වාර්තාවකින් හෝ ලියවිල්ලකින් උපුටාගත් පාඨයක්, පුවත්පත් ලිපියක් හෝ වාර්තාවක් පරිවර්තනය කළ යුතුය.)

අපේක්ෂකයින් තම සුදුසුකම් අනුව ඉහත 6(i) යටතේ භාෂාව ප්‍රශ්න පත්‍රයට හා 6(ii) යටතේ පරිවර්තන ප්‍රශ්න පත්‍ර දෙකකට අනිවාර්යෙන්ම පිළිතුරු සැපයිය යුතුවේ. පරිවර්තන ප්‍රශ්න පත්‍ර දෙක තෝරා ගැනීමේදී ඉහත 01 ඡේදයට අනුව අපේක්ෂකයින් අයදුම්කරන තනතුරට අදාල භාෂා දෙක එකිනෙකට පරිවර්තනය වන පරිදි තෝරා ගත යුතුය. මේ හැර ත්‍රෛභාෂික ප්‍රවීණතාවය මත ඕනෑම අපේක්ෂකයෙකුට තෙවන ප්‍රශ්න පත්‍රයටද පෙනී සිටිය හැක. එක් එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා කාලය පැය දෙකකි.

සටහන : සියලුම උත්තර පත්‍රවල නොපැහැදිලි අත් අකුරු හා අක්ෂර වින්‍යාස දෝෂ සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

07. සේවයට බඳවා ගැනීම සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

08. මෙම විභාගය සඳහා වූ ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම්පතක් මෙම නිවේදනය අවසානයේ පළ කර ඇත. ආදර්ශ අයදුම්පතට අනුකූලව පමණක් අයදුම්කරුවන් විසින් තමන්ගේ අයදුම්පත් පිළියෙල කර ගැනීම අවශ්‍ය වේ. විභාගය සඳහා අයදුම් කිරීමේදී පරිපාලන ගාස්තු වශයෙන් ආපසු නොගෙවන රු. 500 ක මුදලක් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් නමින් මහජන බැංකුවේ වේල්ල වීදිය ශාඛාවේ පවත්වා ගෙනයන ගිණුම් අංක 297100199025039 ට බැර කර ලබා ගන්නා ලදුපත අයදුම් පත්‍රයේ නියමිත කොටුවේ ඇලවිය යුතු වේ.

09. අයදුම්පත් 2012.04.30 දිනට හෝ එදිනට පෙර "ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය, කොළඹ 12." යන ලිපිනයට ලැබෙන සේ ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ. රජයේ සේවයේ නියුතු නිලධාරීන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුවේ.

10. අයදුම්පත්‍ර සම්බන්ධව පැනනගින ගැටළු පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වනු ඇත.

එස්. එන් ගොපල්ලව,
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2012 මාර්තු මස 15 වන දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

**අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ භාෂණ පරිවර්තක II වැනි ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ තරග විභාගය - 2012**

| විභාග අංකය (කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි) |
|---|

(සැලකිය යුතුය - අයදුම්පත්‍රය නිවැරදිව සහ පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතු වේ. අංක 01 සිට 11 දක්වා මුල් පිටුවල ඇතුළත් විය යුතුයි. අදාල කොටුවල නියමිත අංකය සඳහන් කරන්න.)

01. (i) මුලකුරු සමග අගට යෙදෙන නම:————————.
(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම්:————————.

02. ස්ත්‍රී පුරුෂ භාවය : ස්ත්‍රී 01
පුරුෂ 02 ☐

03. ස්ථිර ලිපිනය:————————.
04. ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය:————————.
05. පදිංචි දිස්ත්‍රික්කය:————————.

06. දුරකථන අංකය: ☐☐☐☐☐☐☐☐☐☐

07. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

08. *(අ)* උපන් දිනය:————————.

*(ආ)* අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස:

අවුරුදු :———— මාස :———— දින:————

09. අයදුම්කරන භාෂණ පරිවර්තක තනතුරු 1- සිංහල - දෙමළ
2 සිංහල - ඉංග්‍රීසි ☐
3 දෙමළ - ඉංග්‍රීසි

10. පෙනී සිටීමට අපේක්ෂා කරනු ලබන ප්‍රශ්න පත්‍ර :

(i) 1 සිංහල
2 දෙමළ ☐
3 ඉංග්‍රීසි

(ii) පරිවර්තන

1. සිංහල, දෙමළ භාෂාවට හෝ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම ☐
2. දෙමළ, සිංහල භෂාවට හෝ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම ☐
3. ඉංග්‍රීසි, සිංහල භාෂාවට හෝ දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම ☐

(iii) තෙවන ප්‍රශ්න පත්‍රය ☐
(මෙම ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින්නේ නම් අංකය සඳහන් කරන්න)

11. රජයේ සේවයේ නියුක්ත නම් -

(i) අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව:————————.

(ii) දැනට දරන තනතුර:————————.

(iii) එම තනතුරට පත් කරන ලද දිනය:————————.

(iv) එම තනතුරේ ස්ථිර කරන ලද දිනය හා ලිපි යොමුව:————

(v) කාර්යාලයීය ලිපිනය:————————.

12. සුදුසුකම් :

*(අ)* උපදෙස් මාලාවේ 05 වන ඡේදයේ කුමන අංක යටතේ ඔබ සුදුසුකම් ලබන්නේදැයි සටහන් කරන්න

*(ආ)* අධ්‍යාපන සුදුසුකම් :
(එක් එක් විභාගයේ ප්‍රතිඵල විභාග අංකය සහිතව වෙන් වෙන්ව සඳහන් කරන්න)
ප්‍රධාන සුදුසුකම් : අ.පො.ස. (උසස් පෙළ)
විභාග අංකය :————————.
වර්ෂය:————————.

| අනු. අංකය | විෂය | සාමාර්ථය |
|---|---|---|
| | | |

(ආ) අ.පො.ස. (සා. පෙළ) විභාග ප්‍රතිඵල
වර්ෂය:————. විභාග අංකය :————.

| අනු. අංකය | විෂය | සාමාර්ථය |
|---|---|---|
| | | |

වර්ෂය:————. විභාග අංකය :————.

| අනු. අංකය | විෂය | සාමාර්ථය |
|---|---|---|
| | | |

*සටහන.–* අයදුම්කරුවන් විසින් චක්‍රලේඛයේ සටහන් උපදෙස් පරිදි නියමිත වට්නාකම තැන්පත් කර ලබාගත් රිසිට් පත්‍රය ගැලවිය නොහැකි පරිදි මෙහි අලවන්න.

☐

ඉහත සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බවත්, මෙම විභාගය සඳහා පනවා ඇති නීති පිළිපැදීමට එකඟ වන බවත් ප්‍රකාශ කරමි. මෙහි සඳහන් යම්කිසි තොරතුරක් අසත්‍ය බැව් හෝ වැරදි බැව් හෝ මා තෝරා ගැනීමට පෙර දැනගැනීමට ලැබුණහොත් ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුසු වීමට ද මෙම තනතුරට මා පත්කර ගැනීමෙන් පසුව එම වරද දැනගන්නට ලැබුණහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටද යටත් වන බැව් මා දනිමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය:————————.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

ඉහත නම් සඳහන් අයදුම්කරු මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ සේවය කරන බවත්, ඔහු/ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, ඔහු/ඇය ඉහත තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් මුදා හැරිය හැකි/නොහැකි බවත් දන්වමි.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන,
නම,
නිල මුද්‍රාව.

දිනය:————————.

03-1128

---

**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**බලයලත් සැළසුම් ශිල්පීන් ලෙස සර්වේයර් ජනරාල්ගේ සහතිකය නිකුත් කිරීමේ විභාගය - 2012**

බලයලත් සැළසුම් ශිල්පියෙකු ලෙස වෘත්තියේ යෙදීමට සර්වේයර් ජනරාල් ගේ සහතික පත්‍රය නිකුත් කිරීම සඳහා වන විභාගය කොළඹ දී පවත්වනු ලැබේ. මෙම විභාගය කොටස් දෙකකින් සමන්විත වේ.

(i) වැනි කොටස - බණ්ඩාංක පත්‍ර පිළියෙල කිරීම
(ii) වැනි කොටස - පිඹුරු ඇඳීම

2. විභාගයේ පළමුවැනි කොටස 2012 ජූලි මස 21 වැනි දින දී ද, දෙවෙනි කොටස 2012 ඔක්තෝබර් මස 20 හා 21 යන දිනයන්හි දී ද පැවැත්වෙනු ඇත. පළමු වැනි කොටසින් අසමත් වන අපේක්ෂකයින්ට දෙවෙනි කොටසට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. විභාගයේ කොටස් දෙකෙන්ම එකවර සමත් වන අපේක්ෂකයින්, බලයලත් සැලසුම් ශිල්පීන් සඳහා වන සර්වේයර් ජනරාල්ගේ සහතිකය ලැබීමට සුදුසුකම් ලබනු ඇත.

3. විභාගයේ දී, අපේක්ෂකයින්ට පහත සඳහන් දෑ කළ හැකි බවට මා හට ඒත්තු ගැන්විය යුතු ය.

(අ) ක්ෂේත්‍ර සටහනක් මගින් බණ්ඩාංක පත්‍රයක් නිවැරදිව පිළියෙල කිරීමට හා පරික්‍රමණයක් බණ්ඩාංක කිරීමට

(ආ) කෝණමානය භාවිතයෙන් හා බණ්ඩාංක ආධාරයෙන් නිවැරදිව පිඹුරක් නියැකීමට හා ක්ෂේත්‍රඵලය ගණනය කිරීමට.

4. පහත දැක්වෙන ආදර්ශය අනුව පිළියෙල කර ගත් අයදුම්පත්‍ර රු. 300.00 ක් වටිනා මුදල් ඇණවුමක් හෝ දියතලාව, මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයට මුදල් ගෙවා ලබාගත් රිසිට් පතක් සමග "ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී (විභාග), මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය, දියතලාව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. මුදල් ඇණවුමේ ගෙවීම් ලබන්නා "ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (මැනුම් පුහුණු ආයතනය)" ලෙසද, ගෙවන කාර්යාලය, "දියතලාව" ලෙසින්ද සඳහන් කළ යුතුය. එසේම රිසිට් පතේ මුල් පිටපත හෝ මුදල් ඇණවුමේ මුල් පිටපත අයදුම් පත්‍රය සමග අමුණා එවිය යුතු ය. (කරුණාකර රිසිට් පත හෝ මුදල් ඇණවුම අයදුම් පත්‍රයේ අලවා නොඑවන්න) කවරයෙහි වම්පස ඉහල කෙළවරේ "බලයලත් සැළසුම් ශිල්පීන් ලෙස සර්වේයර් ජනරාල් ගේ සහතිකය නිකුත් කිරීමේ විභාගය - 2012" යනුවෙන් සඳහන් කරන්න. මුද්දර මගින් හෝ චෙක්පත් මගින් කරනු ලබන ගෙවීම් භාරගනු නොලැබේ.

5. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තු කුමන හේතුවක් නිසා හෝ ආපසු ගෙවනු නොලැබේ.

6. අයදුම්පත් 2012 මැයි මස 25 දින හෝ ඊට පෙර ලැබෙනසේ එවිය යුතු ය. එදිනට පසු එවනු ලබන අයදුම්පත් භාර ගනු නොලැබේ.

7. බණ්ඩාංක පත්‍ර හා ඇඳීම් කඩදාසි විභාග ශාලාවේදී සපයනු ලැබේ. කෙසේ වෙතත් අයදුම්කරුවන් විසින් ඇඳීම් උපකරණ ද, බණ්ඩාංක ගණනය කිරීමට අවශ්‍ය ගණිත වගු යනාදිය ද, අවශ්‍ය අනෙකුත් සියළු උපකරණද රැගෙන ආ යුතු ය. විභාග ශාලාධිපති ගේ අවසරය ඇතිව මෘදුකාංග රහිත සාමාන්‍ය විද්‍යාත්මක ගණක යන්ත්‍ර භාවිතා කිරීමට ඉඩ දෙනු ලැබේ.

8. (i) සෑම විභාග අපේක්ෂකයෙකුම විභාග ශාලාධිපති සෑහීමට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතරින් එකක් ඉදිරිපත් කළ හැකිය.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද හැඳුනුම් පත

(ආ) වලංගු ගමන් බලපත්‍රයක්

(ඇ) විභාගය පවත්වන දිනට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුලත ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක අධිකාරිත්වය යටතේ නිකුත් කරන ලද අයදුම්කරුගේ ඡායාරූපයක් ද සහිත බලපත්‍රයක් හෝ අනන්‍යතා ලියවිල්ලක්.

(ii) ඉහත 8(i) හි පරිදි තමන්ගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

9. මෙම විභාගය මෙට්‍රික් ඒකක ක්‍රමය යටතේ පැවැත්වෙනු ඇත.

එස්. එම්. ඩබ්. ප්‍රනාන්දු,
සර්වේයර් ජනරාල්.

2012 මාර්තු මස 15 වැනි දින,
සර්වේයර් ජනරාල් කාර්යාලය,
තැ. පෙ. 506,
කොළඹ 05.

**ආදර්ශ අයදුම්පත**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

*බලයලත් සැළසුම් ශිල්පීන් ලෙස සර්වේයර් ජනරාල්ගේ සහතිකය නිකුත් කිරීමේ විභාගය - 2012*

විභාග අංකය [ ]

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

(අ) (i) මුලකුරු සමග නම :————— මයා/මිය/මෙනවිය
(ii) මුලකුරු වලින් හැඳින්වෙන නම් :—————
(iii) මුලකුරු සමග නම පැහැදිලිව ඉංග්‍රීසියෙන්:—————.

(ආ) ස්ත්‍රී/පුරුෂභාවය :—————
(ඇ) තනතුර :—————
(ඈ) රැකියා ස්ථානයේ ලිපිනය :—————
(ඉ) ස්ථිර ලිපිනය :—————
(ඊ) උපන්දිනය :—————
(උ) අධ්‍යාපන සුදුසුකම් :—————
(ඌ) විභාගයට පෙනී සිටින මාධ්‍ය සිංහල/දෙමළ/ඉංග්‍රීසි :—————.
(එ) ගෙවන ලද ගාස්තු :—————
(ඒ) මුදල් ඇණවුම්/රිසිට්පත් අංකය :—————
නිකුත් කළ කාර්යාලය :—————
දිනය :—————

(ඔබ විසින් දියතලාව, මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයට මුදල් ගෙවන ලද්දේ නම් එම රිසිට් පත හෝ මුදල් ඇණවුමක් මගින් එවන්නේ නම් එම මුදල් ඇණවුමේ මුල් පිටපත හෝ අමුණා එවිය යුතු ය.)

මවිසින් ඉහතින් දක්වා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි තොරතුරු බව සහතික කරමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————

03-1133

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.